# රන් - රිදී හැදීමේ තාක්ෂණය අපේ මුතුන් මිත්තෝ දැන සිටියාහුද?



උපුල් ජනක ජයසිංහ

**සේරුවිල** යපස් නිධිය සේරුවිල අලි ඔලුව ජනපදයේ දැවැන්ත යපස් ඉල්ලමක් ඇති අතර එහි 03% පමණ තඹ ඇති බව 70 දශකයේ දී කළ පර්යේෂණවලදී සොයා ගැනිණ. මෙරට දී මුල්ම යපස් (මැග්නයිට්) සොයා ගැනීම සිදු වූයේ 1971 දීය. ඒ අනුව කරන ලද දැවැන්ත පර්යේෂණවලදී හෙලි වූයේ මෙම යපස් නිධිය අලිඔලුව ජනපදයේ කොටසෙහිද, ආරිප්පු හා කොල්ලන්කුලම යන ප්‍රදේශවල විසිරී පවතින බවය. මෙම භූමි වපසරියේ අඩි 200 භූගත තට්ටුවේදී අඩි 06 ක පැතිරුණ යපස් (මැග්නයිට්) ඛණිජ තට්ටු ඇතැයි මෙහිදී සොයා ගැනිණ. මෙම යපස් හොන් බ්ලෙන්ඩ් ඛණිජයත් පොස්පේට් බහුල ඇපටයිඩ් ඛණිජය ද සමඟ සංඝටනය වී ඇති බවද විද්‍යාඥයෝ සොයා ගත්හ. මෙම ඇපටයිඩ් සහ මැග්නයිට් සංයෝජනයක් මෙරටදී හමුවූ ප්‍රථම අවස්ථාව විය. මෙම ඛණිජ සහිත පස දකුණු ඇමරිකාවේ බටහිර තීරුවේ පුළුල් ලෙස පැතිර ඇති ලෝ පසට බෙහෙවින් සමානය.

මේ යපස් - තඹ නිධිය පිළිබඳව ද රන් රිදී මෙරටින් හමුවීම පිළිබඳව ද ඉතිහාසයේ බොහෝ පුරාවෘත්ත වේ. සමහරක් අතිශයෝක්තියෙන් ගොතනු ලැබූ ඒවා යැයි සැක කළ හැකි අතර තවත් සමහර සාධකවලින් එම කථා සත්‍ය වන තත්ත්වයක් ද වේ. මෙම කථා වෘත්තාන්ත අපේ වංශකථාවල ද සඳහන් වන අතර තවත් සමහර කථා පුරාවිද්‍යා සාධකවලින් තහවුරු වී ඇත.

සේරුවිල යපස් හා බැඳුණු කර්මාන්ත වූ බවට සේරුවිල විහාර භූමියේ තිබී හමු වූ ලෝ බොරවලින් හා ආයුධවලින් ස්ථිර වී ඇත. මහා වංශයට අනුව රුවන්වැලි සෑය තැනීම සඳහා සේරුවිලින් තඹ පිඩි ගෙන ගොස් ඇත. අනුරාධපුර යුගයේ මැටි කරඬු තුළ රන් තහඩු ඔබ්බවා තිබී ඇත. මෙරට රන් ආකර සොළොසක් වූ බවට විත්ති පොතෙ හි දක්වා ඇත. දඹදෙණි යුගයේ ලියැවුණු මෙම ග්‍රන්ථයේ සඳහන් ගම් අද හඳුනාගැනීමට නොහැකි වී ඇත.

අනුරාධපුරයට තුන්ගව්වක් ඊසාන දිගින් අවුරුවිටි ගමේ තුන් රාත්‍රියක් වැසිවට කල්හි තුන් පෑල සාරමුණක් බිජුවට තැන රන් පැළ නැග්ග බව ථූපවංශ පවසයි. දුටුගැමුණු රජුගේ මහ සෑ කර්මාන්තයට රන් ලැබීම පිළිබඳ කතාවේය එම විස්තරය සඳහන් වන්නේ. මේ ප්‍රදේශයේ රන් ආකාරයක් සොයාගත් බවය මෙහි සත්‍ය ප්‍රවෘත්තිය. අවුරුවිටි යනු නූතන කනදරා කෝරළය බව විද්වත්හු පවසති. කනා (රන්) ගැරූ වැව හෙයින් ඒ වැවට කනදරා වැව යැයි ගම්මු කියති. එසේම මේ ආසන්නයේ පිහිටි රන්පත්විල නමින් ගමක්ද වේ.

අප රටට රන් ආනයනය කළ බවක් කිසිදු තැනක අසන්නට දකින්නට නැත. එහෙත් මේ රටේ රන් ඉතා බහුල ලෙස භාවිතා වූ අවස්ථා වංශ කතාවල දැක්වේ. අග්බෝ රජු මහාථූපයට භාර 24 ක රන් ඡත්‍රයක් පූජා කළ බව කියැවේ. (භාර යනු රාත්තල් 140 ක කිරුම් පඩියකි) මේ ඡත්‍රය හොණ්ඩර 53 ක් පමණ වේ. ෂ පරාක්‍රමබාහු රජු වෙළෙඳ ගනුදෙනු සඳහා තම නම කොටන ලද කහාපණ රටපුරා පතුරුවා විසුරුවා හැර ඇත. දෙවැනි උදය රජු රන් කහාපණ 13 ලක්ෂයක් සිය රාජ්‍ය කටයුතු සඳහා වැය කර තිබේ. සේන රජු සෑම පෝ දිනකම දිළින්දන්ට කහ පණ 1000 බෙදාදී ඇත. ඡුස්සදේව යෝදයාට ගරු සම්මාන පිණිස දුටුගැමුණු රජු ඡුස්සදේවගේ ඊතල බිම සිටුවා එය වැසී යන තෙක් කහවණු පිරවූ බව මහ වංශය සඳහන් කරයි.

මෙරට රන් භාවිතා වූයේ කහවණු සඳහාම පමණක් නොව පිළිම හා රාජකීය ආභරණ තැනීමටද රන් බහුල ලෙස යොදා ගෙන ඇත. මහනුවර, යාපහු රාජධානිවල රන්කරුවන් සිටි බවට සාධක ඇත. ඔටුනු පට්ටලේ ආභරණ පට්ටලේ, මූලාචාර්ය යන තනතුරු මහනුවර සමයේ හමුවන්නේ රන්කම් කර්මාන්තයේදීය. 8 වන සියවසේදී දෙවැනි මහින්ද රජු කහාපණ 60,000 වැය කර දඹරන් බුදුරුවක් නිමවා රත්න ප්‍රාසාදයෙහි තැන්පත් කරනු ලැබීය. 9 වන අග්ගබෝධි හා සේන රජුන් ද රන් පිළිම නිමවා ඇත. එසේම රන් ආලේපිත බුද්ධ ප්‍රතිමාද මෙරට සතර අත වෙහෙර විහාරවල දක්නට තිබේ. එසේම එවැනි දේව ප්‍රතිමා ද ඇත.

එසේම රජු ප්‍රමුඛ රදලයින්ද බිසෝවරුද පැළඳි ආභරණ ද රනින් කළ ඒවා විය. විශේෂයෙන් කිරුළ, මඟුල් අසිපත, පේරැ ස් මුද්ද, කර්ණාභරණ, යනාදී ආභරණ රැ සකි. රජුට සෙස්සන්ටද සිය තරාතිරම අනුව ආභරණ පැළඳිය හැක.

එසේ නම්, මේ රන් කර්මාන්ත සඳහා රන් ලැබුණේ කෙසේද? ඒවා විදෙස් රටවලින් ගෙන ආ බවට සාක්ෂි නැත. එසේම ආසන්න රටවලද රන් ආකර තිබුණේ නැත. එසේ නම් මේ සා

*<u>මෙරට රන් භාවිතා වූයේ කහවණු සඳහාම පමණක් නොව පිළිම හා රාජකීය ආභරණ තැනීමටද රන් බහුල ලෙස යොදා ගෙන ඇත. මහනුවර, යාපහු රාජධානිවල රන්කරුවන් සිටි බවට සාධක ඇත.</u>*

විශාල රන් වැඩ සඳහා රන් ලැබුණේ කෙසේද? සමහරවිට තඹ ආදී ලෝහ සම්බන්ධ කරගෙන විවිධ රසායන ද්‍රව්‍ය යොදා මුසු කර රන් මෙහි හැදුවාද විය හැක.

එසේ නැතිනම් එදා රන් යැයි හැඳින්වූ රන් හා අද භාවිතා වන රත්තරන් නොව වෙන යම් සුලභ ලෝහයක්වීද යන්නද සැකය. එසේ නැතිනම් අතීතයේ වූ රන් සහිත ඉල්ලුම් බිම්වලට කුමක් වීද? මහ වංශයේ හැරුණු විට ජනප්‍රවාදවල රන් ඉල්ලම් බිම් ගැන කථා නැතිවීම ද අප රටේ රන් නොතිබූ බවට වන යථාර්ථවාදී සාක්ෂියකි.

රිදී පිළිබඳවද ඇත්තේද මෙවැනිම උභතෝකෝටික තත්ත්වයකි. අනුරාධපුරයට දකුණින් තිස් ගව්වක් ඔබ්බෙහි පිහිටි ඇත්තොට දනව්වේ ලෙනක රිදී පහළ වූ බව ථූපවංශයේ වේ. දුටුගැමුණු රජුට මහ සෑයේ කටයුතුවලට මෙම රිදී පහළ වූ බව සඳහන්ය. ඇත්තොට දනව්ව යනු නූතන කුරුණෑගල රිදී විහාරය පිහිටි රිදීගම බව ප්‍රකටය. රිදී ආකර ගම් හතරක් මෙරට වූ බව කඩයිම් පොත්වල සඳහන් වූවද එම ගම් ද අද හඳුනාගැනීමට නොහැක.

රිදී සහ රන් පිළිබඳ කිරුම් මිණුම් ද අතීතයේ මෙරට ප්‍රචලිතව තිබුණු බවට සාධක ඇත. ප්‍රමිත කාසිය, නික්ඛ යනාදිය ඒ අතර වේ. රිදීවලින් රජවරු විවිධ පූජා භාණ්ඩ තනා ඇත.

14 සියවසේදී ඪ බුවනෙකබා රජු රිදී 7000 වියදම්-න් දන්ත ධාතුවට කරඬුවක් කරවීය. දෙවන පරාක්‍රමබාහු ද දන්ත ධාතුව තැන්පත් කිරීමට කරඬු හතක් හදා පූජා කර ඇත.

රන් රිදී මේ තරම් මෙරට භාවිතා වූ බව සත්‍යයක්ම ද වංශ කථා කතාකරුවන්ගේ ප්‍රබන්ධ ද යන්න ගැටළුව මෙහිදී මතු වේ. මේ තරම් රන් රිදී මෙරට භාවිතවීමට නම් ඒවා මෙරටදී නිෂ්පාදනය කිරීමට හෝ ආකරවලින් ගොඩගත යුතුව ඇත. එහෙත් එසේ රන් ආකර ඉල්ලම් තිබූ ගම්මාන පිළිබඳ තොරතුරු අදටත් රහසකි.

34 වන පිටට

ඔස්ට්‍රේලියාවේ පුවත්පතක කොටස් වශයෙන් පළ වූ පළමු සිංහල නවකතාව දැන් දයාවංශ ජයකොඩි සමාගමේ පොතක් ලෙස

ජගත් ජේ එදිරිසිංහ ලියා
සිතිජය නමින් පහන මාසිකයේ කොටස් වශයෙන් පළ වූ
ජනප්‍රිය නවකතාව




මිල $10
තැපෑලට $2

තැපෑලෙන් ලබා ගැනීමට
සූරිය මාකටිං සර්විසස්
22 Lorne Street Lalor
Vic 3075 Australia
දුරකතන 613 9402 5380

දයාවංශ ජයකොඩි සහ සමාගම

Smart Solutions

Audio
Video

Professional Quality Advertisements
ඔබට අවශ්‍ය සියලුම වෙළඳ දැන්වීම් සඳහා
විමසන්න



Script Writing
Recording
Mixing

Srinath Maddumage 0430077300
Dasun Gajaman 0402 121 825
9402 5380

LATROBE TAXATION SERVICES

14 DAY TAX REFUNDS

INDIVIDUAL RETURNS
$65

BAS/IAS and BUSINESS TAX RETURNS

LATROBE TAXATION SERVICES
Registered Tax Agent and Accountant

Contact
Mala: 94708241 or 0401000421
Email: latrobetax@yahoo.com.au